මගේ අංකය:- රාදැසං4/නිසැස1/63 (iv),
රාජ්‍ය දැව සංස්ථාව,
" සම්පත්පාය"
බත්තරමුල්ල,
...............................

...................................................මයා/මිය,
............................................................,
............................................................,
............................................................

මහත්මයාණෙනි/මහත්මියණි,

<u>**රාජ්‍ය දැව සංස්ථාවේ වැඩබිම් වලින් දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීම.**</u>

මෙම සංස්ථාවේ දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් ඔබ විසින් සපුරාලීම අවශ්‍ය බව කරුණාවෙන් දන්වමි.

(01) නිශ්චල දේපල සම්බන්ධයෙන් රුපියල් ලක්‍ෂ පහක් වටිනාකමට අංක 170 දරණ පොදු ආකෘති පත්‍රයේ ප්‍රාදේශීය ලේකම් විසින් ඔබ නමට මෑතකදී නිකුත් කරන ලද වත්කම් සහතිකයක් හෝ ආදායම් බදු ගෙවූ බවට මෑතක දී ලබාගත් කුවිතාන්සියක් හෝ වාර්ෂික ආදායම රුපියල් ලක්‍ෂ 05ක් බවට ලබාගත් ආදායම් වාර්තාවක්.

(02) (අ)
දැව සැපයීම් කටයුතු සඳහා අවම වශයෙන් ඔබ සතු ලොරි දෙකක් සහ අලියෙකු හෝ ට්‍රැක්ටරයක් තිබිය යුතුය. එම වාහන ඔබ සතු බව ඔප්පු කිරීම සඳහා වාහන ලියාපදිංචි කිරීමේ සහතික සහ අදාල වසරේ ආදායම් සහතික පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අදාල ලිපි ලේඛණ වල මුල් පිටපතක් ද පරීක්‍ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය. මෙම කරුණු වෙන වෙනම සඳහන් කළ යුතුය.

(ආ)
ක්‍රියාකාරි තත්වයේ දම්වැල් කියත් තමන් සතුව තිබෙන බවට සනාථ කළ යුතුය.

(ඇ)
ජංගම ඉරුම්හල් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තමන් සතුව තිබේනම් ඒ බව සනාථ කෙරෙන ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

(ඈ)
දැව සැපයීම් කටයුතු වෙනුවෙන් රු.500,000/= ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යෙදවීමට හැකියාව ඇති බව තහවුරු කළ යුතුය.

(ඉ)
අලි ඔබ සතුව සිටී නම් ඒ බව සනාථ කිරීම සඳහා වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ ප්‍රාදේශීය ලේකම් වෙතින් මෑතකදී ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(......2

(ඊ)

දැව පැටවීමේ යන්ත්‍ර සහ දැව මාර්ගාසන්න කළ හැකි ටිම්බර් ජැක් යන්ත්‍ර වැනි උපකරණ ඉල්ලුම්කරු සතුව පැවතීම අමතර සුදුසුකමක් සේ සලකණු ලැබේ. ඒ බව සනාථ කෙරෙන ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

(03) ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය පරීක්ෂාවට ඉදිරිපත් කළ යුතුය.

(04) කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා මෙම කාර්යාලය වෙත තැපෑලෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කරනු නොලැබේ. ඊට හේතුව නම් තමාගේ හැඳුනම්පත්‍රයේ සඳහන් නම, අංකය පරීක්ෂාවට ලක් කළ යුතු අතර, ඔහුගේම අත්සන බවට මෙම කාර්යාලය සෑහීමට පත්විය යුතුය. ඊට අමතරව තමා විසින් එවනු ලබන ලොරි, ට්‍රැක්ටර් ආදිය පිළිබඳව ඡායා පිටපතක් මුල් පිටපත සමග පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. තවද, ලියාපදිංචි කිරීමේ ගාස්තුව ලෙස රු.2,000/= ක් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයට ගෙවා ලදුපත් මා වෙත ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් , මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ. ඒ නිසා අයදුම් පත්‍රය පුරවා අදාල ලියවිලි සමග මෙම කාර්යාලයට පැමිණෙන මෙන් කරුණාවෙන් දන්වමි.

(05) ඉල්ලුම්කරු/කාරිය විසින් මෑතකදී ලබාගත් 2"x 2 1/2" ප්‍රමාණයේ උඩුකය ඡායාරූප පිටපත් 02 ක් ඉදිරිපත් කළ යුතුය.

(06) රාජ්‍ය දැව සංස්ථාවේ වැඩබිමක් ලබාගෙන ගිවිසුම් අත්සන් කර, එහි සැපයීම් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීම සුදුසුකමක් සේ සළකණු ලැබේ.

(07) රාජ්‍ය දැව සංස්ථාවේ දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවෙකු/කාරියක් වශයෙන් ලියාපදිංචි වූ පමණින් ඔහුට/ඇයට වැඩබිමක් හෝ කොන්ත්‍රාත්තුවක් ලබාදීම හෝ නොදීම සංස්ථාවේ අභිමතය පරිදි සිදුවන අතර, සංස්ථාවේ තීරණය පිළිගැනීමට ඔහු/ඇය එකඟ විය යුතුය.

(08) රාජ්‍ය දෙපාර්තමේන්තු සංස්ථා හා මණ්ඩල ආදියෙහි සේවයේ නියුතු වුවන් දැව ව්‍යාපාර හිමි හෝ ඒවායේ කොටස් හිමි අය සහ එවැනි ව්‍යාපාරික ආයතන දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවෙකු/කාරියක වශයෙන් ලියාපදංචි කරනු නොලැබේ.

**<u>කොන්ත්‍රාත්කරුවන්ගේ ශ්‍රේණිය තීරණය කිරීමේ පදනම පහත දැක්වේ.</u>**

**<u>"ඒ " ශ්‍රේණිය</u>**

නියමිත වටිනාකමට වත්කම් සහතික හෝ ආදායම් වාර්තා හෝ අදායම් බදු කුවිතාන්සි සමග අවම වශයෙන් ධාවන තත්වයේ ලොරි 02 ක් සමග ට්‍රැක්ටරයක් හිමි ක්‍රියාකාරි තත්වයේ දම්වැල් කියත් 02 ක් හෝ ඊට වැඩියෙන් තිබෙන ජංගම ඉරුම්හලක් හිමි ප්‍රාග්ධනය රු.1,500,000/= ක් හෝ ඊට වැඩියෙන් යෙදවීමට හැකියාවක් ඇති බව සනාථ කරන වසර දෙකකට නොඅඩු කාලයක් සාර්ථකව දැව සැපයීම් කළ අය මෙම ශ්‍රේණියට ඇතුළත් කරනු ඇත. එකී දැව සැපයීම් වලදී කිසිදු දඩුවමක් ලබා නොතිබිය යුතු අතර, අවම වශයෙන් සම්පූර්ණ හෙලීම් වැඩබිම් 02 ක් නියමිත කාලය තුල අවසන් කර දී තිබිය යුතුය.

**<u>"බී" ශ්‍රේණිය</u>**

නියමිත වටිනාකමට ඉදිරිපත් කරන වත්කම් සහතිකය/ආදායම් වාර්තාව/ආදායම් බදු කුවිතාන්සි සමග ධාවන තත්වයේ පවතින ලොරි 02 ක් හෝ එක් ලොරියක් සමග ට්‍රැක්ටරයක් හෝ තිබිය යුතුය. ක්‍රියාකාරී තත්වයේ දම්වැල් කියත් 02ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබීම සහ ප්‍රාග්ධනය රු.1,000,000/= ක් හෝ ඊට වැඩි මුදලක් යෙදවීමට හැකියාව ඇති බව සනාථ කළ යුතුය.

**<u>"සී " ශ්‍රේණිය</u>**

නියමිත වටිනාකමට ලබාගත් වත්කම් සහතිකය/ආදායම් වාර්තාව/ආදායම් බදු කුවිතාන්සි සමග ධාවන තත්වයේ පවත්නා ලොරියක් හෝ ට්‍රැක්ටරයක් හිමි ක්‍රියාකාරී තත්වයේ දම්වැල් කියත් එකක් හෝ ඇති අය විය යුතු අතර, ප්‍රාග්ධනය රු.500,000/= ක් හෝ ඊට වැඩියෙන් යෙදවීමට හැකියාව ඇති බව සනාථ කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)**
**රාජ්‍ය දැව සංස්ථාව.**

SPW/S

එස්ටීසී/ටීඑස්/ඒ ආකෘතිය

## රාජ්‍ය දැව සංස්ථාව - කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් පත.

(01) සම්පූර්ණ නම:-

(02) මුලකුරු සමග නම:-

(03) ලිපිනය:-

(04) ජාතික හැඳුනුම් පත්‍රය/පාස්පෝට්/රියදුරු බලපත්‍ර අංකය:-

(05) රැකියාව:-

(06) ස්ත්‍රී පුරුෂභාවය:-

(07) තමන් සතු ලොරි ගණන හා අංක:-

1.

3.

2.

4.

(08) තමන් සතු ට්‍රැක්ටර් ගණන:-

1.

3.

2.

4.

(09) තමන් සතු අලි ඇත්නම් ඒ වග හා ගණන:-

(10) වෙනත් දැව හෙලීම්, ඇදීම්, පැටවීම් සඳහා ඇති උපකරණ පිළිබඳ විස්තර:-

(11) ඉදිරිපත් කර ඇති වත්කම් සහතිකයේ වටිනාකම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:-

(12) ආදායම් බදු ගෙවන්නේ නම් අන්තිම වරට ගෙවන ලද විස්තර:-

(13) දැව කොන්ත්‍රාත් සඳහා යෙදවිය හැක ප්‍රාග්ධනය කොපමණද?

(14) තමා වැඩ කිරීමට කැමති ප්‍රදේශය:-

(15) තමා සතුව දැව ව්‍යාපාර හෝ දැව ඉරුම්හල් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-

(16) තමා සතු ජංගම ඉරුම්හල් ගණන:-

(......02

ඉහත සඳහන් කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත්, මා රාජ්‍ය ආයතනයක රැකියාවක නියුක්ත වූවෙක් නොවන බවත්, කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වුවද වැඩබිමක් හෝ කොන්ත්‍රාත්තුවක් ලබාදීමට රාජ්‍ය දැව සංස්ථාව පොරොන්දු වී නොමැති බවත්, මා හොඳින් දන්නා බවත්, එකී පොරොන්දුව මත ලියාපදිංචිය ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන බවත්, පහත අත්සන් කර පිළිගනිමි. මම කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කරන ලෙසද ඉල්ලා සිටිමි.

ඡායාරූපය අලවන්න.

..................................
අයදුම්කරුගේ අත්සන

දිනය:-...................................

**<u>කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.</u>**

(01) ලියාපදිංචි ගාස්තු ගෙවූ කුවිතාන්සි අංකය හා දිනය:-

(02) ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීම අනුමත කරමි / නොකරමි.

(03) සුදුසුකම් මත ලබාදිය යුතු ශ්‍රේණිය - ඒ, බී,සී.

.............................................
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(මෙහෙයුම්) /
සහකාර සාමාන්‍යාධිකාරි (ප්‍රාදේශික)

මගේ අංකය :- රාදැසං4/දැසැ2/207/2009,
රාජ්‍ය දැව සංස්ථාව,
බත්තරමුල්ල,
.............................

................................................ මයා/මිය,
................................................
................................................
................................................

මහත්මයාණෙනි/මහත්මියණි,

**<u>ඩී ශ්‍රේණියේ කොන්ත්‍රාත් ලියාපදිංචිය සඳහා සුදුසුකම්.</u>**

(01) රජයේ ආයතන, අධිබල විදුලි රැහැන් මාර්ග, මහා මාර්ග සහ පුද්ගලික නිවාස හා දේපල වලට අනතුරුදායකව පිහිටි රජයේ ඉඩම් වල තිබෙන ගස් කපා හෙලා ඉවත් කිරීම හා මංසල මිලදී ගැනීම සඳහා ඩී ශ්‍රේණිය යටතේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

(02) මේ සඳහා අයදුම්කරන අය රජයේ, සංස්ථා හා මණ්ඩල ආදියෙහි රැකියාවල නියුතු අය නොවිය යුතු අතර, දැව ව්‍යාපාර, දැව අලෙවිහල් හෝ දැව ඉරුම්හල් හිමි අය නොවිය යුතුය.

(03) ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු.500/= ක මුදලක් අයකරන අතර, එය මුදලින් පමණක් ගෙවිය හැක.

(04) ඉල්ලුම්කරුගේ/කාරියගේ මෑතකදී ලබාගත් අඟල් 2 1/2 x 2 ප්‍රමාණයේ උඩුකය ඡායාරූප පිටපත් 02 ක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

(05) දැව ඉවත් කිරීම් වලදී අවශ්‍ය වුවහොත් සංස්ථාව මගින් නියම කරනු ලබන මුදලත්, ඇප මුදලක් වශයෙන් තැන්පත් කිරීමට හැකියාවක් ඇති අය විය යුතුය.

(06) සියළුම දැව හෙලීම හා ඉවත් කිරීම ටෙන්ඩර් හෝ මුද්‍රිත මිල ගණන් කැඳවීම මත පමණක් පවරනු ලැබේ.

(07) ටෙන්ඩර් හෝ මුද්‍රිත මිල ගණන් කැඳවූ දැව කපා හෙලා සංස්ථා ගබඩා වලට සපයන්නේ ද එම ස්ථානයේදීම ඉල්ලුම්කරුට/කාරියට අලෙවි කරන්නේ ද යන්න පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති හා ඔහුගේ අනුප්‍රාප්තිකයන් සතුවන අතර, එම නියමයට අනුව කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරු/කාරිය බැඳී සිටිය යුතුය.

(08) ලියාපදිංචි වූ පමණින් දැව සැපයීම් පැවරීමට සංස්ථාව වගකීමෙන් බැඳී නොමැත.

(09) වැඩි විස්තර හා අයදුම්පත් පහත ලිපිනයෙන් හෝ රාජ්‍ය දැව සංස්ථාවේ සියළුම ප්‍රාදේශීය කාර්යාල මගින් ද ලබාගත හැක.

දුරකථන අංක 011-2866611
011-2885854
011-2866620

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
රාජ්‍ය දැව සංස්ථාව.

**<u>රාජ්‍ය දැව සංස්ථාව.</u>**

**<u>රාජ්‍ය ආයතන වල පිහිටි ගොඩනැගිලි හා වෙනත් දේපල වලට අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සහ මංසල දී මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය.</u>**

(01) සම්පූර්ණ නම:-..........................................................................................

(02) මුලකුරු සමග නම:-..........................................................................................

(03) ලිපිනය:-..........................................................................................
..........................................................................................

(04) ස්ත්‍රී/පුරුෂ භාවය:-.................(05) ජාතික හැඳුනුම්පත් අංකය:.............................

(06) කොන්ත්‍රාත් කිරීමට කැමති දැව සංස්ථා ප්‍රාදේශිකය:-.............................................
(ඔබට ටෙන්ඩර්පත් හා මිල ගණන් පත් එවීමේ පහසුව සඳහා ප්‍රාදේශිකයක් නම් කරන ලෙස ඉල්ලා ඇත. එහෙත් කැමති ඕනෑම ප්‍රදේශයක කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් විය හැක.)

(07) ලියාපදිංචි වන්නේ ගස් කපා හෙලා ඉවත් කිරීම සදහාද දර මිළදී ගැනීම සදහා ද එම කාර්යයන් දෙකටමද යන්න ..........................................................................

(08) දැනටමත් සංස්ථාවේ කොන්ත්‍රාත්වල යෙදී ඇත්නම් ඒ පිළිබද විස්තර ......................

(09) දැනට ඔබ සතු වාහන යන්ත්‍ර සූත්‍ර ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්න
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. රාජ්‍ය දැව සංස්ථාවේ නීතිරීති වලට එකඟව කොන්ත්‍රාත් කටයුතු වල යෙදීමට එකඟ වෙමි. ලියාපදංචි වූ පමණින් කොන්ත්‍රාත් කටයුතු පැවරීමට සංස්ථාව වගකීමෙන් බැඳී නොමැති බව පිළිගනිමි. මෙම කොන්ත්‍රාත් කටයුතු වලදී සිදුවන ජීවිත, දේපළ හා වෙනත් අලාභ හානී පිළිබඳ වගකීමෙන් හා වන්දි ගෙවීමෙන් රාජ්‍ය දැව සංස්ථාව හා එහි අනුප්‍රාප්තිකයන් සම්පූර්ණයෙන්ම නිදහස් බව පිළිගනිමි.

අත්සන............................................

දිනය..............................................

(ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි)

(01) ඉල්ලුම්කරු/කාරිය මා හඳුනන/නොහඳුනන බවත්, ඉදිරිපත් කර ඇති විස්තර මාගේ දැනීමේ හැටියට සත්‍ය බවත් ප්‍රකාශ කරමි.

(02) ලියාපදිංචි වීමේ ගාස්තුව වශයෙන් රු.500/= ක මුදලක් මෙම කාර්යාලයට ගෙවූ අතර, ඒ වෙනුවෙන් අංක.......................... හා .............................. දිනැති කුවිතාන්සිය නිකුත් කරන ලදී.

(03) ඉල්ලුම්කරුගේ/කාරියගේ උඩුකය ඡායාරූපය (2" x 2 1/2" ප්‍රමාණය)

තවත් එක් ඡායාරූප පිටපතක් ද මේ සමග ඉදිරිපත් කරමි. මෙම ඡායාරූපය ඉල්ලුම්කරුගේ/කාරියගේ බව ද සහතික කරමි.

ජ්‍යේෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර/ප්‍රාදේශීය කළමනාකාර
(නිල මුද්‍රාව තබන්න)

දිනය :-...............................

(ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණයි)

ඉහත සඳහන් ඉල්ලුම්කරු/කාරිය අංක.............................. හා ඩී ශ්‍රේණිය පමණක් ලියාපදිංචි කිරීමට අනුමැතිය පතමි.

පාලන නිළධාරි/ විෂය ලිපිකරු

දිනය :-...................................

ලියාපදිංචි කිරීම අනුමත කරමි/නොකරමි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)/ සහකාර සාමාන්‍යාධිකාරි
රාජ්‍ය දැව සංස්ථාව.

දිනය:-.................................